## 387 අපමණ සෙත මට

අපමණ සෙත මට සැලසූ සමිඳුට
දිව් හිමියෙන් මම තුති පුදමි
අසරණ මා හට සරණ වූ දෙවිඳුට
නිරතුරු මම බැති ගී ගයමි

මාගේ ආත්මය සමිඳුන් ගැන උදම් / අනන්තේය
මාගේ හෘදය ගැලවුම්කාර දෙවිඳුන් තුළ ප්‍රීති / වන්නේය
මක්නිසාදයත් එතුමාණෝ තම දාසියගේ අසරණ/කම කෙරෙහි
කරුණාවෙන් සිය නෙත් යොමු / කළ සේක
අහෝ බලන්න සියලු පරම්පරාවෝ / මතු කලට
මට භාග්‍යවන්තී යයි කියන්නෝය
මක්නිසාදයත් බලවත් වූ තැනැන් වහන්සේ /
මට මහත් දේ / කළ සේක
උන්වහන්සේගේ නාමය සුවිශුද්ධය
උන්වහන්සේ උඩඟු සිතැති සියලු දෙන /
සිය සිතුවිලි සමඟ විසිරවූ සේක
සාගින්නෙන් පෙළෙන්නන් / හොඳ දෙයින්
පෝෂණය කළ / සේක  ධනවතුන් හිස් අතින්
යාමට සැලසූ / සේක
පිතා පුත්‍රයා සහ ශුද්ධාත්මයාණන්ට / තුති වේවා
දැනුත් සදහටත් මහි / මය වේවා